(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 218.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2012 ඔක්තෝබර් මස 24 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1885/'11

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම දිසා රෝහලේ ඉදිකර ඇති තෙමහල් ගොඩනැගිල්ල භාවිතයට නොගෙන අතහැර දමා ඇති බවත්;

(ii) එම ගොඩනැගිල්ල විවෘත කළ ද ඊට අවශ්‍ය උපකරණ ලබා නොදීම නිසා භාවිතයට නොගෙන අත්හැර දැමීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, අවශ්‍ය උපකරණ කඩිනමින් ලබා දී ගොඩනැගිල්ල මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා ගැනීමට අවශ්‍ය කටයුතු කරන්නේද;

(ii) අවශ්‍ය උපකරණ ලබා දෙන්නේ නම්, එම දිනය කවරේද;

(iii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

(v) මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා එම ගොඩනැගිල්ල නැවත විවෘත කරන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2109/'11

2.

ගරු ජෝන් අමරතුංග මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) සේවක අර්ථසාධක අරමුදල විසින් සීමාසහිත ගලදාරි හෝටල් ලංකා සමාගම, සීමාසහිත ලාෆ්ස් ගෑස් සමාගම සහ සීමාසහිත සිලෝන් ග්‍රේන් එලිවේටර්ස් සමාගම යන සමාගම්වල ලබාගෙන ඇති කොටස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කොටස් ප්‍රමාණයන් මිලදී ගත් දිනයන් කවරේද;

(iii) ඉහත කී කොටස් ගත් මිල කවරේද;

(iv) එම කොටස් මිලට ගත්තේ කවර පුද්ගලයන්ගෙන්ද;

(v) ඉහත කී කොටස් මිලට ගැනීමෙන් පසු විකුණන ලද්දේ නම්, එම එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද්දේ කවර පුද්ගලයින් හටද;

(vi) ඉහත කී එක් එක් කොටස් ප්‍රමාණය විකුණන ලද මිල කවරේද;

(vii) මෙම ගනුදෙනුවලට සම්බන්ධවූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2149/'11

3\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පැමිණීමේ හා ප්‍රවාහන දීමනා වශයෙන් වර්ෂ 2005 සිට මේ දක්වා ආයතන සේවකයින් වෙත ගෙවා ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගෙවීම් සඳහා භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ ලේඛන සභාගත කරන්නේද;

(iv) භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන නොමැති නම්, එයට හේතු කවරේද;

(v) එම ගෙවීම සඳහා අනුමතිය ලබා දුන් පුද්ගලයා හෝ පුද්ගලයින් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2197/'11

4\.

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රවාහන අමාත්‍යාංශය තුළ වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එකී ලේඛනය පවත්වාගෙන යන පුද්ගලයාගේ නම කවරේද;

(iii) අමාත්‍යාංශයෙහි ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(iv) අමාත්‍යාංශයේ වැඩිම වැදගත්කම සහිත වත්කම් පහ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය තුළ කිසියම් ව්‍යාජ වත්කම් පවතින බව වත්කම් පරීක්ෂාකර බැලීම තුළින් අනාවරණය වී තිබේද;

(ii) එසේ නම්, එම වත්කම් හා ඒවායේ වටිනාකම් කවරේද;

(iii) එම වත්කම් පොත්වල සටහන් කර තිබේද;

යන්නද එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2227/'12

5\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, උතුරු සහ නැගෙනහිර පළාත්වල අවතැන්වූවන් යළි පදිංචි කරවීම සඳහා නිවාස 15,000ක් ඉදිකිරීමේ වැඩසටහනක් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට මුදල් වෙන්කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වනවිට වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) එම වැඩසටහන යටතේ මේ වනවිට ඉදිකිරීම් අවසන්කර ඇති නිවාස සංඛ්‍යාව

කොපමණද;

(iii) එම නිවාසවල පදිංචිකර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2312/'12

6\.
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ රජයේ අනුමතිය ඇතිව ක්‍රියාත්මක වන විදේශීය විශ්වවිද්‍යාලවලට අනුබද්ධව උපාධි සහ පශ්චාත් උපාධි පිරිනමන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනයේ නම, ලිපිනය, දුරකථන අංකය සහ ලියාපදිංචි වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ආයතනවල ප්‍රමිතිය අධීක්ෂණය කරන රජයේ ආයතනය කවරේද;

(iv) අවසන්වරට ප්‍රමිති අධීක්ෂණයක් සිදුකළ ලද වර්ෂය සහ එම ප්‍රමිති අධීක්ෂණයට ලක්වූ උසස් අධ්‍යාපන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ අනුමතිය නොමැතිව මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක උපාධි සහ පශ්චාත් උපාධි පිරිනමන පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන ලියාපදිංචිය ලබාගත යුතු ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්ෂ 2000 සිට 2010 දක්වා උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වී ඇති ශ්‍රී ලාංකික සිසුන් සංඛ්‍යාව හා විදේශ රටවලින් ශ්‍රී ලංකාවට සංක්‍රමණය වී ඇති සිසුන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2427/'12

7\.
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ප්‍රධාන ආපනශාලාව බදු දී ඇති ආයතනය කවරේද;

(ii) එම ආයතනයට රෝහල් ආපනශාලාව බදු දුන් දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ආයතනය යටතේ පාලනය වන රෝහල් ආපනශාලාව මගින් සේවකයන්ට හා රෝගීන්ට සහන ගාස්තු මත ආහාරපාන සපයන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම ආයතනය මගින් පාන්පිටි නිෂ්පාදනවලට අමතරව වෙනත් ආහාර ලබාදෙන්නේද;

(ii) දියවැඩියා රෝගීන් සඳහා එම ආපනශාලාව මගින් ලබාදෙන පාන්පිටි නොවන ආහාර කවරේද;

(iii) එම ආපනශාලාව මගින් දියවැඩියා රෝගීන් හා අනෙකුත් රෝගීන් සඳහා පාන්පිටි නොවන ආහාර ලබාදීම ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2491/'12

8.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බහරේන්හි සේවය කළ, අක්මීමන, හියාරේ, නුගේකන්ද ප්‍රදේශයේ පදිංචි මාදුගැට ගමගේ ධර්මවතී නැමැති තිදරු මවට ඇය සේවය කළ අදාළ නිවසේ හිමිකාර කාන්තාව විසින් බලෙන් කම්බි කොකු ගිල්වීම හේතුවෙන් අසාධ්‍යව මේ වනවිට ශ්‍රී ලංකාවට ගෙන්වා ඇති බවත්;

(ii) විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක 'සහන් පියස' රක්ෂණ ක්‍රමය යටතේ ඇය හිමිකම් මුදලක් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සහන් පියස රක්ෂණ ක්‍රමය යටතේ ධර්මවතී මහත්මියට හිමිකම් මුදලක් ලබාදීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2525/'12

9.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දෙසැම්බර් 31 වනවිට,

(i) පළාත් සභාවන්හි පාලනය යටතේ පැවති පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල සිටි ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරුවරුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එක් එක් පළාත් සභාව අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එක් එක් පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශ මගින් එම පළාත් සභා යටතේ පාලනය වන පාසල් සඳහා 2012 වර්ෂයට අදාළව වෙන්කර ඇති මුදල් ප්‍රමාණයන් කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2851/'12

10.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000 අංක 9 දරන වැඩිහිටි අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත යටතේ, "වැඩිහිටි හැඳුනුම්පත්" නිකුත් කරනු ලබන්නේද;

(ii) එම හැඳුනුම්පත පිටුපස සෞඛ්‍ය සේවා, බැංකු සේවා, පොලිස් සහ නීති උපදෙස්, තැපැල් හා විශ්‍රාම වැටුප් සහ කාර්යාල කටයුතු යන සේවාවන්වලදී හැඳුනුම්පත්ලාභියාට ප්‍රමුඛතාවයක් ලැබිය යුතු බව සඳහන් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත කී ප්‍රමුඛතාවය ලබා දීම සඳහා,

(i) රජය විසින් සකස් කොට ඇති නීති හා පනවා ඇති රෙගුලාසි කවරේද;

(ii) එම නීති සහ රෙගුලාසි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අවම වශයෙන් රජයේ රෝහලක වෛද්‍යවරුන් මුණ ගැසීම, සායනයන්ට සහභාගී වීම සහ බෙහෙත් ලබාගැනීම යන කටයුතුවලදී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ප්‍රමුඛතාව ලබාදීම සඳහා නීතිමය බලය ලැබෙන චක්‍රලේඛයක් සහ / හෝ රෙගුලාසියක් හැකි ඉක්මනින් නිකුත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1886/'11

11.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, අම්බලන්ගොඩ ථානායමට අයත් ගොඩනැගිලි කඩා දමා යළි ඉදිකිරීමට මුල් ගල් තබා වර්ෂ දෙකකට වැඩි කාලයක් ගත වී ඇතත්, මේ දක්වා එම ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ථානායම නැවත ඉදිකිරීමේ කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) එම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අම්බලන්ගොඩ නගර සභාව සතු මෙම ගොඩනැගිලි කඩා දැමීමට රුහුණු සංචාරක කාර්යාලයට බලය හිමි වූයේ කෙසේද;

(ii) එම ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවදාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2150/'11

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1992 වර්ෂයේ දී ගුවන් තොටුපල හා ගුවන් සංතරණ අධිකාරියට අරමුදල් රැස් කිරීම පිණිස ආරම්භ කළ ලොතරැයිපතේ වටිනාකම කොපමණද;

(ii) මේ වනවිට මුද්‍රණය කර ඇති එම ලොතරැයිපත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ලොතරැයිපතේ නම කුමක්ද;

(iv) එම ලොතරැයිපතින් ලැබූ ලාභය හෝ අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ලොතරැයිය දිනුම් අදින ලද දිනය කවරේද;

(vi) ඒ යටතේ බෙදාදුන් ත්‍යාග කවරේද;

(vii) ඉහත ලොතරැයිපත ආරම්භ කිරීමෙන් අපේක්ෂිත ඉලක්ක මේ වනවිට

සපුරාගෙන තිබේද;

(viii) එසේ නම්, ඊට අදාළ තොරතුරු ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2198/'11

13.

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තුළ වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන්නේද;

(ii) එසේ නම්, එකී ලේඛනය පවත්වාගෙන යන පුද්ගලයාගේ නම කවරේද;

(iii) අමාත්‍යාංශයෙහි ශුද්ධ වත්කම්වල වටිනාකම කොපමණද;

(iv) අමාත්‍යාංශයේ වැඩිම වැදගත්කමක් සහිත වත්කම් පහ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශය තුළ කිසියම් ව්‍යාජ වත්කම් පවතින බව වත්කම් පරීක්ෂාකර බැලීම තුළින් අනාවරණය වී තිබේද;

(ii) එසේ නම්, එම වත්කම් හා ඒවායේ වටිනාකම් කවරේද;

(iii) එම වත්කම් පොත්වල සටහන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2228/'12

14.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, නිවාස අහිමි සැමට ඉදිරි වර්ෂ හය තුළ තමන්ගේම නිවසක හිමිකාරීත්වය ලබා දීම සඳහා රජයේ පූර්ණ මැදිහත්වීමෙන් අලුතින් නිවාස ලක්ෂ හයක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස්කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත සඳහන් සැලසුම් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, මේ වනවිට නිවාස හිමි වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2526/'12

15.

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දෙසැම්බර් 31 වනවිට,

(i) මෙරට පැවති ජාතික පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල සිටි ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරුවරුන් සංඛ්‍යාව;

(iii) ජාතික පාසල් සඳහා 2012 වර්ෂය වෙනුවෙන් වෙන්කළ මුළු මුදල;

(iv) මේ වනවිට විදුහල්පති පුරප්පාඩු පවතින ජාතික පාසල් සංඛ්‍යාව;

(v) ජාතික පාසල්වල පළමුවැනි ශ්‍රේණියට ඇතුළුවීම සඳහා 2011 සහ 2012 වර්ෂ තුළදී ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව;

(vi) ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාවෙන් එම පාසල්වලට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමග කියවිය යුතු, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 13 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය, 16 වැනි වගන්තිය සහ 112 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2012 පෙබරවාරි 21 දිනැති අංක 1746/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.10.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— 2011.08.15 දින සිට පත් කරනු ලැබූ වත්මන් විගණකාධිපතිවරයා වන එච්. ඒ. එස්. සමරවීර මහතාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව අනුව පහත සඳහන් පරිදි විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

විගණකාධිපති එච්. ඒ. එස්. සමරවීර මහතා එම තනතුරට පත්කළ 2011.08.15 වැනි දින සිට SL- 4 - 2006 වැටුප් පරිමාණයේ 2 වැනි පියවර වන රු.48,940.00 පියවරේ පිහිටුවා වැටුප්

ගෙවීම, තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීම සහ වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම කළයුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

3.

චන්ද්‍රිම වීරක්කොඩි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

4.

නිමල් සිරිපාල ද සිල්වා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

දිවිනැගුම පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්ති යටතේ 2011.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද 2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.11.03 දින සලකා බලන ලදි.)

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහල, සීදූව වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.02.24 වැනි දින ඉදිරිපත් කරන ලද 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.04.05 දින සලකා බලන ලදි.)

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.11.11 වැනි දින ඉදිරිපත් කරන ලද 2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2012.06.19 දින සලකා බලන ලදි.)

*13.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2009,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2011.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද, 2009.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2011.11.03 දින සලකා බලන ලදී.)

*14.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2010,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2012.06.07 වැනි දින ඉදිරිපත් කරන ලද 2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2012.06.19 දින සලකා බලන ලදි.)

*15.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක

1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."
යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*18.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවි අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

19.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

21.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**